# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2005 අංක 22 දරන බන්ධනාගාර (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කලේ **2005** අගෝස්තු මස **02** වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2005 අගෝස්තු මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. **4.25** යි. තැපැල් ගාස්තුව : රු. **5.00** යි.

**2005 අංක 22 දරන බන්ධනාගාර (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2005 අගෝස්තු මස 02 වන දින]

එල්. ඩී.—ඕ. 46/2004.

**බන්ධනාගාර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත 2005 අංක 22 දරන බන්ධනාගාර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) බන්ධනාගාර ආඥාපනතේ 79 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 54 වන අධිකාරයේ 79 වන වගන්තිය සංශෝධනය කිරීම.

(i) එම වගන්තියේ (උ) ඡේදය ඉවත් කිරීමෙන් ;

(ii) එම වගන්තියේ (ඌ) ඡේදය (උ) ඡේදය ලෙස නැවත අකුරු යෙදීමෙන්.

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (4) වන උපවගන්තියේ—

(අ) එහි (ඇ) ඡේදය ඉවත් කිරීමෙන් ; සහ

(ආ) එහි (ඉ) ඡේදය, (ඇ) ඡේදය වශයෙන් නැවත අකුරු යෙදීමෙන් ;

(2) එම වගන්තියේ (5) සහ (6) උපවගන්ති ඉවත් කිරීමෙන් ; සහ

(3) එම වගන්තියේ (7) සහ (8) උපවගන්ති, (5) සහ (6) උපවගන්ති ලෙස නැවත අංක යෙදීමෙන්.

**4**. ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තිය ඉවත් කිරීම.

**5**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.